# අනේ කාලේ නගරේ වාසේ

අප ජීවත්වන්නේ කුමන්ත්‍රණ, සටකපට උපක්‍රම ආදිය ගහණ අවධියක ය. සිංහල බෞද්ධ කතානායකතුමා (කතානායක යන නිලයට ආගමක් නැතැයි මැට් පඬියකු තර්කකිරීමට ඉඩ ඇත.) මහජන මුදලින් (එනම් සිංහල බෞද්ධයන් බහුතරයක් ඇති ජනකායක) පාර්ලිමේන්තු සේවකයන්ට අයවැයෙන් පසුව කරන සංග්‍රහයක් ලෙස දක්වමින් නත්තල් උත්සවයක් පවත්වයි. එතුමා ආණ්ඩුවේ වියදමෙන්වත් එලෙස වෙසක් උත්සවයක් පැවැත්වූ බවට ආරංචියක් නැත. කතානායකතුමාගේ නත්තල් උත්සවයට බෞද්ධ භික්ෂූන්වහන්සේ ද සහභාගිවෙති. මෙරට කතෝලික පල්ලියේ ප්‍රධානියා වන ඔස්වල්ඩ් ගෝමස් බිෂොප්තුමා භික්ෂූන්වහන්සේට කෑම මේසයේ දන් පිලිගන්වයි. බුදුන්වහන්සේට දන්දුන්නෝ බෞද්ධ උපාසක උපාසිකාවෝ පමණක් ම නො වූහ. මිසදිටුවෝ ද උන්වහන්සේට දන්දුන්හ. එබැවින් බිෂොප්තුමාගේ දනට ඇතැම් භික්ෂූන්වහන්සේ වැඩමකිරීම වරදක් නොවේ යැයි කිසිවකුට තර්කකිරීමට හැකි ය. එමෙන් ම මේ භික්ෂූන්වහන්සේ සහභාගි වූයේ සාංඝික දානයකට නොවේ යැයි ද කියන්නෝ වෙති. පිවුසිගා වඩින විට බෞද්ධ අබෞද්ධ ගෙවල් තේරීමට නොහැකි බව ද සැබෑ ය. එහෙත් මේ තර්ක එකක්වත් මෙහි දී අදාළ නො වේ. බිෂොප් උපාසකතුමාට හෙවත් උපාසක බිෂොප්තුමාට දන්දීමට එතරම් ම අවශ්‍යතාවක් තිබිණි නම් බොරැල්ලේ බිෂොප් නිවසට ආසන්නයේ ඇති පන්සලක භික්ෂූන්වහන්සේට දන්පිළිගැන්වීමේ හැකියාව තිබිණි. එමෙන් ම ඒ බවක් ජනමාධ්‍යවලට දැන්වීමට ද අවශ්‍ය නො වේ. මේ පින් බලාපොරොත්තුවෙන්වත් ලෝභය නැතිකිරීම සඳහාවත් දුන් දානයක් නොවන බව පැහැදිලි ය. මේ දානමය පින්කමක් නො වේ. චෙතානහං භික්ඛවෙ කම්මං වදාමි යන බුදු වදනට අනුව කල්පනාකළහොත් අපට පෙනී යන්නේ කුමක් ද? දනට වැඩමකළ භික්ෂූන්වහන්සේට බිෂොප්තුමාගේ සිත කියවීමට හැකියාවක් තිබිණි දැයි නො දනිමු. අපට නම් එවැනි හැකියාවක් නැත. එහෙත් රටේ තොටේ වැඩ සිද්ධවන්නේ කෙසේ ද යන්න පිළිබඳව අපට සාමාන්‍ය දැනුමක් ඇත.

මේ දානය ද වෙනත් ඇතැම් දාන මෙන් ම දේශපාලන දානයකි. කතානායකතුමාගේ නත්තල් උත්සවය ද දේශපාලන උත්සවයකි. එය එතුමාගේ පෞද්ගලික ධනයෙන් නොව මහජන මුදලින් සංවිධානය කරන ලද්දකි. එතුමාට උත්සවය පිළිබඳ අදහස, සිතිවිල්ල කෙසේ ඇතිවිණි දැයි එතුමාගෙන්වත් අසා දැනගැනීමට හැකි යැයි නො සිතමි. එතුමා මෙරට වැඩියෙන් ම බොරු කියන තැනක ප්‍රධානියා ය. කෙසේ වෙතත් මේ දේශපාලන උත්සව පැවැත්වෙන්නේ ඇයි ද යන්න අප තේරුම්ගත යුතු ය. බොරු වළවල් තනා බුදුන්වහන්සේ ඝාතනයකිරීමේ අපේක්ෂාවෙන් උන්වහන්සේට දනට ආරාධනය කළ මිසදිටුවන් ගැන අපි අසා ඇත්තෙමු. ඒ මිසදිටු දානය ශ්‍රද්ධාවෙන් දුන් එකක් නොවන බව ඉතා පැහැදිලි ය. ඒ දානය ද දේශපාලන දානයක් විය. එහි අරමුණ වූයේ බුදුන්වහන්සේ ඝාතනයකර ඇතැම් ආගම්වල දේශපාලන ආධිපත්‍යය තහවුරුකිරීම ය. බිෂොප්තුමාගේ දනට වැඩමකළ භික්ෂූන්වහන්සේ එවැනි ජීවිත ඝාතනයකට භාජනය නොවන බව උන්වහන්සේ දැන සිටින්නට ඇත. එමෙන් ම කතානායකතුමාගේ නත්තල් උත්සවයට සහභාගි වූ භික්ෂූන්වහන්සේ ද එයට අහිංසකව ම වැඩම කරන්නට ඇත. එහෙත් නත්තල් සමයේ දී සිදු වූ මේ දේශපාලන උත්සව දෙක එකම අරමුණක් ඇතිව සිදු වූ බව පැහැදිලි ය. මේ උත්සව ඊනියා ආගමික සහජීවනය පෙරදැරි කරගෙන සංවිධානයකෙරෙන්නේ යැයි පැවසෙනු නොඅනුමාන ය.

පසුගිය දා ආනන්දසංගරී මහතා ප්‍රකාශයක් කරමින් කියා සිටියේ උතුරු හා නැගෙනහිර පළාත්සභා වෙන්කිරීම මේ වෙලාවේ නොකළ යුතු දෙයක් බව ය. අද ඉන්දියාව මේ සම්බන්ධයෙන් ලංකාණ්ඩුවට ඉතා තදින් බලපෑම්කරන බව රහසක් නො වේ. ඉන්දියාවට අවශ්‍ය ඒ පළාත්සභා දෙක එකක් ලෙස පවත්වාගෙන යෑම ය. පළාත්සභා මෙන් ම උතුරු හා නැගෙනහිර පළාත්සභා එක්කිරීම ද ඉන්දියාව විසින් අපට පටවනු ලැබූ මර උගුල් වෙයි. එසේ පැටවීමේ දී සමස්තයක් ලෙස ගත්කල මෙරට හෝ උතුරු හා නැගෙනහිර පළාත්වල හෝ ඉතිහාසය, භූගෝලය, සංස්කෘතිය, ජනගහන ව්‍යාප්තිය ආදී කිසිවක් ඉන්දියාවේ සැලකිල්ලට භාජනය නො විණි. ඈත අතීතයේ සිට ම ඉන්දියාව (භාරතය) අපට විරුද්ධ බව ද අපි අමතක කරමු. අපට එහි සිටි මිතුරන් ගණන අතේ ඇඟිලිවලින් ගණන් කළ හැකි යැයි සිතමි. බුදුන්වහන්සේ, මිහිඳු මහ රහතන් වහන්සේ, සංඝමිත්තා මෙහෙණින් වහන්සේ, අශෝක රජතුමා, පසුව රජකළ කිහිප දෙනකු හැරෙන්නට අපට එතරම් හිතවතුන් සංඛ්‍යාවක් අවුරුදු තුන්දහසක පමණ ඉතිහාසයක භාරතයෙන් සොයාගත නො හැකි ය. අද ඉන්දියාවටත් බටහිරටත් බිෂොප්තුමන්ලාටත් ඇති ප්‍රශ්නයක් නම් සිංහල බුද්ධාගම ය. අවුරුදු දෙදහස් පන්සියක් රැකගත් (සිංහල) බුද්ධාගම තවත් අවුරුදු දෙදහස් පන්සීයක් රැකගැනීමට අපි කතාකරමු. එය ඔවුන්ට ප්‍රශ්නයක් නොවන්නේ යැයි අපි සිතමු ද? දෙමළ ජාතිවාදය යනු බටහිර ක්‍රිස්තියානි

© Prof. Nalin De Silva

සංස්කෘතියෙහි ප්‍රතිඵලයක් බව අප කියා ඇත. මෙය ඊනියා බෝල්කනීය වෙන්කිරීමක් සඳහා පවත්වාගෙන යන්නක් නොවන බව දෙමළ ජාතිවාදයට ඉන්දියාවේ ආධාරය ලැබීමෙන් ම පැහැදිලි වෙයි. දෙමළ ජාතිවාදය අවසාන වශයෙන් ගත්කල ඉන්දියාවට ද තර්ජනයක් වන බව එරට නොදන්නේ දැයි ප්‍රශ්නකරන්නෝ සිටිති. ඒ සම්බන්ධයෙන් කිවයුත්තේ එවැනි තර්ජනයක් නැති බව ය. තමන්ට අවශ්‍ය දේ, එනම් මෙරට සිංහල බෞද්ධ සංස්කෘතිය ද ඇතුළත් වූ සිංහලත්වය දුර්වලකිරීම, කරගැනීමෙන් පසුව දෙමළ ජාතිවාදය මිරිකන ලද දෙහි ලෙල්ලක් මෙන් විසිකර දමන්නේ කෙසේ දැයි ඉන්දියාව මෙන් ම බටහිර රටවල් ද දනියි. අද ඉන්දියාව යනු මේ කලාපයේ බටහිර රටවල නියෝජිතයා වෙයි.

මුළු මහත් දෙමළ ජාතිවාදය ම ප්‍රධාන මිථ්‍යා දෙකක් මත ගොඩ නගනු ලැබුවේ බටහිර රටවල් විසිනි. එක් මිථ්‍යාවක් වූයේ මෙරට දෙමළ ජනයා මධ්‍යයේ පාලනයෙහි දී කොටස්කරුවන් නොකරගත් බව ය. අනෙක බ්‍රිතානීන් විසින් බෙදා වෙන්කරන ලද උතුරු හා නැගෙනහිර පළාත් දෙමළ ජනයාගේ සාම්ප්‍රදායික වාසභූමි බව ය. මේ දෙකම පට්ටපල් බොරු වෙයි. ඒ සම්බන්ධයෙන් යමකුට තවමත් සැකයක් පවතින්නේ නම් ප්‍රභාකරන් ඔහුගේ සීයලා බාප්පලා මස්සිනාලා කෘතිය කියවිය හැකි ය. ඉහත සඳහන් මිථ්‍යාවන්ට අමතර ව  තව තවත් ද්විතීයික මිථ්‍යා රාශියක් භාවිතා වෙයි. ඉන් එකක් වනුයේ ලංකාව බහුසංස්කෘතික බහු ආගමික රටක් බව ය. මේ පිළිබඳව ද අප බොහෝ කරුණු දක්වා ඇත. එහෙත් සිංහලයන්ට වියුක්තව සිතීමේ දී ප්‍රශ්න ඇති බැවින් තවමත් මේ කරුණු ඔවුන්ගේ සිත්වලට ගිය බවක් පෙනේනට නැත. මෙරට ද බටහිර රටවල හා ඉන්දියාවේ මෙන් ම විවිධ සංස්කෘතීන් හා ආගම් පවතින බව පැහැදිලි ය. එහෙත් බටහිර රටවල හා ඉන්දියාවේ ඒ සංස්කෘතීන් හා ආගම් සමානත්වයෙන් නො සැලකෙයි. මේ සම්බන්ධයෙන් උදාහරණ රැශියක් දිය හැකි ය. බටහිරයන්ට හා ඉන්දියාව ට අප රටේ දී අවශ්‍ය වන්නේ බහු සංස්කෘතියක නාමයෙන් සියළු සංස්කෘතීන්ට හා සියළු ආගම්වලට එක සමාන ව සැලකීම ය. සියළු ආගම්වලට එක ලෙස සලකන රටක් බටහිර තිබේ ද? ඉන්දියාවේ බෞද්ධයන්ට සලකන්නේ කෙසේ ද? මුස්ලිමුන්ට සලකන්නේ කෙසේ ද? එහි ඉස්ලාම් භක්තිකයකු ජනාධිපති වී ඇත. සික්වරයකු අගමැති වී ඇත. එහෙත් ව්‍යවස්ථාවෙහි කුමක් තිබුණත් ඔවුහු ඉන්දියාවෙහි හින්දු  ආගමෙහි හා හින්දු සංස්කෘතියෙහි ප්‍රධානත්වය නො පිළිගනිත් ද?

මෙරට ව්‍යවස්ථාවෙහි බුද්ධාගමට ප්‍රමුඛස්ථානය දීම පිළිබඳ ව ආනන්දසංගරී මහතා මෙන් ම භික්‍ෂූන්වහන්සේට දන්දෙන බිෂොප් උපාසකතුමා ද  නත්තල් උත්සව මිස වෙසක් උත්සව නොපවත්වන කතානායකතුමා ද කියන්නේ කුමක් ද? බිෂොප්තුමාගේ දානයෙහි බොරු වල ඇත්තේ මෙතැන ය. දනට වැඩම කරන භික්‍ෂූන්වහන්සේ එහි වැටී සඟවා තිබූ උල්වල ඇනී අපවත් නොවෙති. එහෙත් සිංහල බුද්ධාගම නම් නැතිවීමට කරුණු සැලසෙයි. බිෂොප්තුමාට කළ හැකි කාර්යයක් වෙයි. මෙරට සිංහල බෞද්ධ සංස්කෘතිය අනෙක් සංස්කෘතීන්ට වඩා වැදගත්බව පිළිගෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි බුද්ධාගමට ප්‍රමුඛස්ථානය දීම අනුමතකරමින් ප්‍රකාශයක් කිරීම රූපවාහිනී කැමරා ඉදිරියෙහි භික්‍ෂූන්වහන්සේට කෑම මේසවල දන්දීමට වඩා වටියි. කෑම මේසයේ දන්දීමෙන් බිෂොප්තුමා සිංහල බෞද්ධ සංස්කෘතිය බොරු වලක වට්ටවයි. වලේ වැටෙන්නේ උලේ ඇනෙමින් බව බෞද්ධ සාහිත්‍යයෙන් අපි තේරුම් ගනිමු. භික්‍ෂූන් වහන්සේ දන් වළඳන්නේ බිෂොප්තුමා ආහාර අනුභව කරන සංස්කෘතියට එකඟව නොවන බව එතුමා නොදන්නේ ද? කතානායකතුමා ගැන කතාකිරීමට දෙයක් නැත. එතුමා ද වලේ වැටී දඟලන විට එතුමාගේ නමින් වෙනත් අය සංවිධානය කරන උත්සව ගැන කතාකිරීම අනවශ්‍ය ය. මෙවැනි අවස්ථාවක අපේ පැරැන්නකු  කියා ඇත්තේ අනේ කාලේ වනේ වාසේ කියා ය. ඇතැම් විට ඒ කියමන අදාළ අවස්ථාවට උචිත වූවා විය හැකි ය. එහෙත් මෙකලට ගැලපෙන පරිදි මේ කියමන අප වෙනස්කළ යුතු ය. අද උදා වී ඇත්තේ මේ සියල්ල හැරදමා වනගත වීම නො වෙයි. අද සියල්ල සිදුවන්නේ නගරයෙහි ය. එනම් බටහිරයන් විසින් නිර්මාණය කරන ලද නගරයෙහි ය. අද විවිධ දාන උත්සව ඔස්සේ ද බටහිර ලෝක ආධිපත්‍යය අපට පටවන්නේ නගරය කේන්ද්‍රකරගෙන ය. අප සියළු දෙනාට ම එකතු විය හැකි නම් බටහිර බලවේග පරාජය කළ හැකි ය. එහි දී රට කුඩා හෝ විශාල වීම ප්‍රශ්නයක් නො වේ. කියුබාව, ඉරානය ආදී රටවල් පෙන්නුම් කර ඇත්තේ මේ බව ය. අපට අද නැත්තේ එක් මතයකි. ජාතිකත්වය පිළිබඳ ප්‍රශ්නය අද ආර්ථික (තෙල්) ප්‍රශ්නයක් බවට පත්කිරීමේ තර්ජනයක් ද පවතියි. බටහිරයන්ගේ නගරය ජාතිකත්වයට අහිතකර නමුත්  බොරු වල නොවැටී බටහිර ආධිපත්‍යය පරාජය කිරීමට නගරයේ ජීවත්විය යුතු ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva